**21-08-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, යක්ෂ මත පසුපස ගොස් ඔබ දැන් ගෙයක් දොරක් නැති අනාථ අසරණයින් වෙලා. දැන් දේව මත අනුගමනය කිරීමෙන් ඔබ සතුටු දේශයට යනු ඇත.

**ප්‍රශ්නය:** ඔය දරුවන් පියා කෙරෙහි තබාගෙන සිටිනා බලාපොරොත්තු මොනවාද? තබා නොගත යුතු බලාපොරොත්තු මොනවාද?

**පිළිතුර:** පරමාත්ම පියා කෙරෙහි තබාගත යුතු එකම එක බලාපොරොත්තුව නම් ඔහු ඔබව පාරිශුද්ධ කරවා ඔබගේ නිවහනට හා රාජ්‍යය වෙත ගෙන යනවාය යන්නයි. බාබා කියනවා : දරුවනි, අසනීපයෙන් සිටිනා කෙනෙකුට මම ආශිර්වාද කරයි කියා සිතන්න එපා. මෙහිදී කරුණාව හෝ ආශිර්වාද කියා දෙයක් නොමැත. මා පැමිණ සිටින්නේ ඔය දරුවන්ව අපිරිසිඳු බවින් පාරිශුද්ධ කරවීමටයි. තව තවත් පාප ක්‍රියා සිදු නොවන ආකාරයේ ක්‍රියා ගැන මම දැන් ඔබට උගන්වනවා.

**ගීතය:** අද නැතිනම් හෙට මේ අඳුරු වළාවන් දුරු වී යාවි...

ඕම් ශාන්ති. ඔය ආධ්‍යාත්මික දරුවන්ට ගීතය ඇසුණා. තමන් දැන් නිවහන බලා යා යුතු බවත් පරමාත්ම පියා ඔබව ආපසු ගෙන යාමට පැමිණ සිටිනා බවත් ඔය දරුවන් දන්නවා. මෙය සිහි කර ගත හැක්කේ ඔබ ජීව අවධානයෙන් සිටිනා විට පමණි. ශාරීරික අවධානයෙන් සිටිනවා නම් ඔබට මෙය මතක් කර ගත නොහැකියි. බාබා මඟියෙක් ලෙසින් පැමිණ සිටිනා බව ඔය දරුවන් දන්නවා. ඔබලාත් මෙහි පැමිණියේ මඟියෙක් ලෙසිනුයි. දැන් ඔබලාට ගෙදර අමතක වෙලා. පරමාත්ම පියා දැන් ඔබට නැවතත් ඔබගේ ගෙදර සිහි කර දී සතෝප්‍රධාන් වූයේ නැතිනම් ඔබට ඒ ගෙදරට යා නොහැකි බවත් සෑම දිනකම පැහැදිලි කර කියා දෙනවා. බාබා කියන දේ හරි බව ඔය දරුවන්ටත් තේරෙනවා. පරමාත්ම පියා ඔය දරුවන්ට ශ්‍රීමත් දුන් විට කීකරු අය ඉක්මනින්ම ඒ උපදෙස් පිළිපදිනවා. මේ කාලයේ නිවැරදි උපදෙස් දිය හැකි වෙනත් පියෙක් නැහැ. මෙන්න මේ නිසා තමයි ඔබලා ගෙයක් දොරක් නැති අය බවට පත්ව තිබෙන්නේ. එකම එක පරමාත්ම පියා පමණයි ඔබට ශ්‍රීමත් දෙන්නේ. ඇතැම් දරුවන් ඔහුගේ උපදෙස් පිළිපදින්නේ නැති එකත් මහා පුදුමයක්. ඔවුන් තම ලෞකික පියාගේ උපදෙස් හරිම පහසුවෙන් පිළිපදිනවා. ඒවා යක්ෂ උපදෙස්. මේකත් නාටකයේම ඇත්තක්. කෙසේ වෙතත්, ඔහු ඔය දරුවන්ට පහදා කියනවා: ඔබ ඒ තත්ත්වයට පත්ව සිටින්නේ යක්ෂ උපදෙස් අනුගමනය කිරීමෙනුයි. දැන් දේව උපදෙස් අනුගමනය කළහොත් ඔබ සතුටේ දේශයට යාවි. ඒ ඔබගේ අසීමිත උරුමයයි. ඔහු සෑම දිනකම ඔබට පහදා දෙනවා. එමනිසා, ඔය දරුවන් ඉතාමත් ප්‍රමෝදමත්ව සිටිය යුතුයි. සෑම කෙනෙකුටම මෙහි නතර වීමට අවසර නැහැ. නිවසේ සිටිනා ගමන් වුවත් ඔබ ඔහුව සිහි කළ යුතුයි. මෙම කොටස දැන් අවසන් වීමටයි යන්නේ. ඔබ දැන් නිවහන බලා යා යුතුයි. මිනිසුන්ට මෙය මුළුමනින්ම අමතක වෙලා. අහවල් පුද්ගලයා තම ගම රට එහෙම පිටින්ම අමතක කර දමලායි කියා ඇතැම් අය ගැන කියනා විට කියනවා. පරමාත්ම පියා දැන් කියනවා: ඔබගේ නිවහනත් රාජ්‍යයත් සිහි කරන්න. අපගේ චරිත කොටස් දැන් අවසන් වෙමිනුයි යන්නේ. අපි දැන් නිවහන බලා යා යුතුයි. ඔබට මෙය අමතක වෙලාද? බාබා, නාටකයේ හැටියට නිවහනත් අමතක වී මංමුලා වී එහේ මෙහේ ගිය චරිතයක් තමයි අපට ලැබී තිබුණේ. තම උතුම්ම ධර්මයත් කර්මයත් අමතක කළ භාරතවාසීන් පමණයි තම දිව්‍යමය ධර්මයෙන් හා ක්‍රියාවන්ගෙන් දූෂිත වූයේ. පරමාත්ම පියා දැන් ඔබට අනතුරු අඟවා තිබෙනවා: ඔබගේ ධර්මය හා කර්මය තිබුණේ මේ ලෙසිනුයි. ඔබ කුමන ක්‍රියාවක් කළද ඒ සියල්ල විශේෂ ආනුභාවයකින් තොරයි. ඔය දරුවන්ට කර්ම නියාමය, අකර්ම හා පාපකර්ම ගැන කියා දෙන්නේ පරමාත්ම පියාම පමණයි. ස්වර්ණමය යුගයේදී ක්‍රියා අකර්මයි. රාවණ රාජ්‍යයේ ක්‍රියා පාප ක්‍රියායි. පරමාත්ම පියා දැන් පැමිණ සිටින්නේ ඔබගේ ධර්මය හා කර්මය උතුම් කරවීමටයි. එම නිසා දැන් ශ්‍රීමත් අනුගමනය කර උසස් ක්‍රියාම කරන්න. දූෂිත ක්‍රියා කර කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. එය දේව දරුවන්ගේ ක්‍රියාවක් නොවෙයි. ඔබට ලැබෙනා සෑම ක්‍රියාවක්ම අනුගමනය කර දිව්‍යමය ගුණධර්ම ධාරණය කර ගන්න. ඔබගේ ආහාරත් පාරිශුද්ධ විය යුතුයි. ඉතාමත් අපහසුකාරී තත්ත්වයකදී ඔබට නිසි අහරක් ගත නොහැකිව සිටිනවා නම් ඒ සඳහා උපදෙස් ගන්න. ඔබගේ රාජකාරි ස්ථානයේදී වෙනත් යම් යම් දේ ආහාරයට ගැනීමට ඔබට සිදු වෙන බව බාබාට තේරෙනවා. යෝග බලයෙන් රාජ්‍යයක් ස්ථාපනය කර අපිරිසිඳු ලෝකය පිරිසිඳු කර ගන්නා එකේ ආහාර පිරිසිඳු කර ගැනීමත්

ලොකු දෙයක් නොවෙයි. ඔබ රැකියාවට යා යුතුයි. දැන් තමන් පරමාත්ව පියාට අයිති කෙනෙක් නිසා සියල්ල අතහැර දමා මෙහි ඇවිත් නතර විය හැකියි කියා දෙයක් නැහැ. දරුවන් රැසක් සිටිනවා. ඒ සැමටම මෙහි සිටිය නොහැකියි. සැම කෙනෙක්ම තම තමන්ගේ පවුලේ අයත් සමඟ වාසය කළ යුතුයි. තේරුම් ගන්න: මම ජීවාත්ම සත්තාවකි. බාබා පැමිණ සිටින්නේ අපව පාරිශුද්ධ කරවාගෙන නැවතත් නිවහන වෙතට ගෙන යාමටයි. ඉන් පසුව අපි අපගේ රාජ්‍යය වෙතට යමු. මෙය රාවණගේ විජාතීය අපිරිසිඳු රාජ්‍යයයි. නාටක සැලැස්මට අනුව ඔබ මුළුමනින්ම අපිරිසිඳු වෙලා. පරමාත්ම පියා කියනවා: මම දැන් ඔබව අවදි කරවීමට පැමිණ සිටිමි. එම නිසා ශ්‍රීමත් අනුගමනය කරන්න. ශ්‍රීමත් අනුගමනය කළ තරමට ඔබ උසස් වේවි. දෙව්ලොව පාලකවරුන් බවට ඔබව පත් කළ පියාව දැන් තමන්ට අමතක වී ඇති බව ඔබලාට තේරෙනවා. බාබා දැන් පැමිණ සිටින්නේ ඔබලාව අළුත් කරවීමටයි. එම නිසා ඔබලා ඉතාමත් හොඳින් අළුත් විය යුතුයි නේද? අසීමිත පියාව තමාට මුණ ගැසී ඇත කියා ඔබ සතුටු විය යුතුයි. ඔය දරුවන් ඔබලා එකිනෙකා අතර කතා බස් කර ගන්නවා වගේ ඔහුත් ඔබ අමතා කතා කරනවා. ඔහුත් ජීවාත්ම සත්තාවකි. ඔහු පරමාත්ම ජීවයයි. ඔහුටත් රඟ පෑමට චරිතයක් තිබෙනවා. ඔය ජීවයන් නළුවන්ය. ඉහළම ඉහළ තත්ත්වයේ සිට පහළම පහළ තත්ත්වය දක්වා චරිත තිබෙනවා. භක්ති මාර්ගයේදී දෙවියන් සැම දෙයක්ම කරනවායි කියා කියනවා. පරමාත්ම පියා කියනවා: අසනීපව සිටින්නන් සනීප කරවන ආකාරයේ චරිතයක් නොවෙයි මගේ චරිතය. මගේ චරිතය පාරිශුද්ධ වීමේ මඟ ඔබලාට පෙන්වා දීමයි. පාරිශුද්ධ වීමෙන් ඔබලාට නිවහන බලා ගොස් පසුව රාජ්‍යය කරා යා හැකියි. අහවල් අහවල් කෙනා සිටින්නේ අසනීපයෙන්. එමනිසා ඔහුට වරම් ලැබිය යුතුයි වැනි දේ පියාගෙන් බලාපොරොත්තු විය නොහැකියි. නැහැ: කරුණාව හෝ ආශිර්වාද කියා දෙයක් මගේ ළඟ නැහැ. ඒ සඳහා ඔබට සාධු සන්‍යාසිවරුන් ළඟට යා හැකියි. ඔබ මට කන්නලව් කර කරා සිටියා: අහෝ පාරිශුද්ධකරුවාණෙනි වඩිනු මැනව. අපව පාරිශුද්ධ ලෝකයට ගෙන යනු මැනව. එමනිසා පරමාත්ම පියා ඔබගෙන් අහනවා: මම ඔබව වස සයුරෙන් එහාට එතෙර කරවනවා. ඉතින් ඇයි ඔබ වස සයුරේ එරී සිටින්නේ? භක්ති මාර්ගයේ ඔබ සිටිනා තත්ත්වය එහෙමයි. ඥානය හා භක්තිය ඇත්තේ ඔබ වෙනුවෙනුයි. සන්‍යාසිවරුන් පවා ඥානය, භක්තිය හා නිරාශාව ගැන කතා කළත් එහි තේරුම ඔවුන් දන්නේ නැහැ. ඔබගේ සිහියේ දැන් ඥානයත් භක්තියත් තිබෙනවා. පසුව නිරාශාව ඇති වේවි. ඉතින් එම නිසා අසීමිත නිරාශාවක් ඉගැන්විය හැකි කෙනෙක් සිටිය යුතුයි. මෙය සොහොන් බිමක් බව පියා ඔබට කියා තිබෙනවා. පසු කාලෙකදි එය සුර දේවතා දේශයක් වේවි. එහි සැම ක්‍රියාවක්ම අකර්මයි. පරමාත්ම පියා දැන් ඔබට කිසිම පාපකාරි ක්‍රියාවක් කළ නොහැකි ආකාරයේ ක්‍රියා ගැන කියා දෙනවා. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. අපිරිසිඳු අය විසින් පිසූ ආහාර කෑමට ගන්න එපා. පාපයේ ගැලෙන්න එපා. අහිංසක අයට පහර කෑමට සිදු වන්නේ මෙම පාපය නිසායි. මායා බාධක ඇති කරවන්නේ කෙසේද කියා ඔබට දිගටම දැක ගත හැකි වේවි. මේ සියල්ල නොපෙනෙන දේවල්ය. යක්ෂයින් හා දේවතාවරුන් අතර යුද්ධයක් තිබුණා කියා කියනවා. පාන්ඩවයින් හා කෞරවයින් අතරත් ගැටුමක් තිබුණායි කියා කියනවා. කෙසේ වෙතත්, ඇත්තේ එකම එක යුද්ධයකුයි. පරමාත්ම පියා පහදා කියනවා: මම උගන්වන්නේ ඔබගේ අනාගත උපත් 21 කටයි. මෙය මරණීය දේශයයි. සත්‍ය නාරායන් වීමේ කතාවටප මිනිස්සු ඇහුම් කන් දී ගෙන සිටියත් ඉන් ඔවුන් කිසිම ඵලයක් ලබන්නේ නැහැ. ඔබ දැන් සැබෑ ගීතාව කියා දෙනවා. සැබෑ රාමායනයත් ඔබ කියා දෙනවා. එක රාමා හෝ සීතා කෙනෙක් ගැන නොවෙයි ඉන් කියවෙන්නේ. මේ කාලයේදී මුළු ලෝකයම ලංකාවයි (දූපතක්). වටේටම වතුර. මෙය අසීමිත ලංකාවයි. ඒ මත තමයි රාවණ රාජ්‍යය පැතිරිලා තිබෙන්නේ. එකම එක පරමාත්ම පියා මනාලයා වන අතර අන් සැම කෙනෙක්ම මනාලියනුයි. පරමාත්ම පියා දැන් ඔබව රාවණ රාජ්‍යයෙන් නිදහස් කර ගන්නවා. මෙය ශෝක කුටියයි. ස්වර්ණමය යුගය හඳුන්වන්නේ අශෝක (ශෝකයෙන් තොර) කුටිය කියලයි. එහි කිසිම දුකක් නැහැ. මේ කාලය වන විට සැම තැනකම පැතිරී ඇත්තේ දුකම පමණි. දුකක් නැති එකම එක ජීවාත්මයක්වත් නැහැ. - අශෝක හෝටලය - වැනි නම් සඳහන් වී තිබෙනවා. පරමාත්ම පියා කියනවා: මේ කාලයේදි මුලු ලෝකයම අසීමිත හෝටලයක් කියා සැලකිය යුතුයි. එය ශෝක හෝටලයකි. මිනිසුන්ගේ කෑම බීම පවා සිව්පා සතුන්ගේ වගේ වෙලා. බලන්න පියා ඔබව ගෙන යන්නේ කොහාටදැයි කියලා. දුකින් තොර සැබෑම කුටි ඇත්තේ ස්වර්ණමය යුගයේයි. සීමිත හා අසීමිත දෙකෙහි වෙනස ඔබට පෙන්වා දෙන්නේ පරමාත්ම පියාම පමණයි.ඔය දරුවන් ඉතාමත් සතුටින් සිටිය යුතුයි. බාබා ඔබට උගන්වනා බව ඔය දරුවන් දන්නවා. ඔබගේ රාජකාරියත් එයමයි: සැම කෙනෙකුටම මඟ පෙන්වන්න. අන්ධයින්ට සැරයටියක් වන්න. ඔබලා ළඟ පින්තූර තිබෙනවා. පාසලකදී ගුරුවරයෙක් සිතියමක් ගෙන මෙන්න මෙතන මේ රට කියා පෙන්වා කියා දෙනවා. ඔබටත් එලෙස කියා දිය හැකියි: ඔබ ජීවයක්. ශරීරයක් නොවෙයි. සියලුම ජීවයන් සහෝදරයින්ය. ඔබ ඔවුන්ට කියා දෙන්නේ එතරම්ම සරල දෙයක්. අපි සැම කෙනෙක්ම

සහෝදරයින් කියා ඔවුන් කියනවා. පරමාත්ම පියා කියනවා: ඔය සෑම ජීවයක්ම සහෝදරයින්ය. ඔබ දෙවි පියාණන් ගැන කතා කරනවා. එම නිසා, ඔබලා කිසිදු විටෙක රණ්ඩු සරුවල් නොවිය යුතුයි. ශරීර ගත් විට ඔබලා සහෝදර සහෝදරියන් වෙනවා. ශිව් බාබාගේ දරුවන් වන ඔබ සෑම කෙනෙක්ම සහෝදරයින්ය. ඒ වගේම ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් වශයෙන් ඔබලා සහෝදර සහෝදරියන්ය. ඔබලා තම සීයාගෙන් තම උරුමය දිනා ගත යුතුයි. මෙන්න මේ නිසා තමයි ඔබලා සීයාව සිහි කරන්නේ. මම මේ දරුවාව (බ්‍රහ්මා) මට අයිති කර ගත්තා. මම ඔහුට ඇතුලු වුණා. ඔබට දැන් මේ සියල්ලම හොඳින් වැටහෙනවා. පරමාත්ම පියා කියනවා: දරුවනි, අලුත් දිව්‍යමය පවුල් මාර්ගය දැන් ස්ථාපනය වෙමින් පවතිනවා. ඔය සියලුම බ්‍රහ්ම කුමාරයින් හා කුමාරීන් අනුගමනය කරන්නේ ශිව් බාබාගේ උපදේශයනුයි. බ්‍රහ්මා පවා පිළිපදින්නේ ඔහුගේ උපදෙසුයි. පරමාත්ම පියා කියනවා: තමා ජීවාත්මයක් බව සලකා පරමාත්ම පියාව සිහි කරමින් අනිකුත් සෑම සබඳතාවයක්ම අඩු කර දමන්න. පැය අටක ස්මරණයක් තිබිය යුතුයි. ඉන් අනතුරුව ඔබට විවේක ගත හැකියි. ව්‍යාපාරික කටයුතු වල නිරත විය හැකියි. ඕනෑම දෙයක් කළ හැකියි. ඉතිරි පැය 16 දී ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් කර ගත හැකියි. තමන් පරමාත්ම පියාගේ දරුවෙක් බව අමතක කරන්න එපා. මෙහි පැමිණ නේවාසිකාගාරයක නතර විය හැකියි කියා සිතන්න එපා. නැහැ. ඔබගේ දරු පවුලත් සමඟ ඔබ ජීවත් විය යුතුයි. ඔබ පියා ළඟට පැමිණෙන්නේ ඔබව ප්‍රාණවත් කර ගැනීමටයි. මධුබනය දැක ගැනීමට කියා මිනිස්සු මදුරයට හෝ ව්‍රින්දාවනයට (ක්‍රිෂ්ණා හා සම්බන්ධ තැන්) යනවා. ඔවුන් එහි කුඩා ආකෘතියක් තබා තිබෙනවා (භක්ති මාර්ගයේ). මෙම අසීමිත කරුණු අවබෝධ කර ගත යුතුයි. ශිව් බාබා බ්‍රහ්මා මඟින් නව ලෝකය නිර්මාණය කරනවා. අපි, බ්‍රහ්ම කුමාරයින් හා කුමාරියන් ප්‍රජාපිතා බ්‍රහ්මගේ දරුවනුයි. මෙහි කිසිම ආකාරයක පාපයක් තිබෙන්න බැහැ. කෙනෙක් කිසියම් පූජකවරයෙකුගේ අනුගාමිකයෙක් වුණු විට තම ඇඳුම් පැළඳුම් වෙනස් කරගෙන ඔහු පූජක ඇඳුම් ඇඳ ගන්නවා. ඔහුගේ නමත් වෙනස් වෙනවා. මෙහිදීත්, ඔබ මෙහි පැමිණ බාබාට අයිති වුණු විට, බාබා ඔබගේ නම් වෙනස් කරනවා. විශාල පිරිසක් බතියේ සිටියා. කිසිම කෙනෙක් මෙම බතිය ගැන දන්නේ නැහැ. ග්‍රන්ථ වල එවන් කතාන්දර ලියා තිබෙනවා. මේ සෑම දෙයක්ම නැවතත් සිදු වේවි. ඔබගේ බුද්ධියේ දැන් ලෝක චක්‍රය කැරකෙනවා. පරමාත්ම පියාත් ස්වදර්ශන චක්‍රධාරීය. ලෝකයේ මුල, මැද හා අග ගැන ඔහු දන්නවා. බාබාට තමාටම කියා ශරීරයක් නැහැ. ඔබලාට භෞතික ශරීර තිබෙනවා. ඔහු පරමාත්ම ජීවයයි. ස්වදර්ශන චක්‍රය කරකවන්නේ ජීවාත්මයයි. එවන් ආභරණ ඇති ජීවයක්ම පෙන්වන්නේ කෙසේද? මෙය අවබෝධ කර ගත යුතු කරුණක්. මෙම කරුණුත් සූක්ෂමයි. පරමාත්ම පියා කියනවා: ඇත්තෙන්ම කියනවා නම් මම ස්වදර්ශනචක්‍රධාරියි. ඔය ජීවාත්මයන් මුලු ලෝක චක්‍රයේම ඥානය ලබනා බව ඔබලා දන්නවා. බාබාත් අප සෑම කෙනෙක්මත් පරම නිර්වාණ දනව්වේ නිවැසියෝ වෙමු. පරමාත්ම පියා පැමිණ ඔබට උපදෙස් දෙනවා: දරුවනි, මමත් ස්වදර්ශන චක්‍රය කරකවන්නෙක්මි. පාරිශුද්ධකරු වන මා ඔබ ළඟට පැමිණ සිටින්නෙමු. පැමිණ ඔබලාව පාරිශුද්ධ කරවා මුක්තිය කරා ගෙන යන්නයි කියා ඔබලා කන්නලව් කළා. ඔහුට ඔහුගේම කියා ශරීරයක් නැහැ. ඔහු ඉපදීම හා මරණය යන දෙකෙන් ඔබ්බෙහි සිටින්නෙකි. ඔහු උපතක් ගත්තත් එයද දිව්‍යමය උපතකි. මිනිස්සු ශිව ජයන්තිය හෝ ශිව් රාත්‍රිය සමරණවා. පරමාත්ම පියා කියනවා: මා පැමිණෙන්නේ රාත්‍රිය අහවර වුණු විටයි. එමනිසා මා පැමිණෙන්නේ එයට හිමිදිරිය ගෙන ඒමටයි. ඒ දවසේදී ඔබ උපත් 21 ක් ලබනා අතර රාත්‍රියේදී උපත් 63 ක් ලබනවා. විවිධ උපත් ගන්නේ ඔය ජීවාත්මයනුයි. දහවලින් රාත්‍රියට පැමිණිය ඔය ජීවයන් දැන් නැවතත් දහවලට යා යුතුයි. ඔබලාව ස්වදර්ශන චක්‍රධාරින් කරවනවා. මගේ චරිත කොටස රඟ දැක්වෙන්නේ මෙම කාලයේදියි. මමඔබලාවත් ස්වදර්ශනචක්‍රධාරීන් කරවනවා. එවිට ඔබලා අන් අයවත් ඒ තත්ත්වයට පත් කරවිය යුතුයි. ඔබලා උපත් 84 ක් ගන්නේ කෙසේද යන චක්‍රය ඔබට පහදා දී තිබෙනවා. මෙම ඥානය ඔබට මීට පෙර තිබුණා ද? නැත්තටම නැහැ. ඔබලා සිටියේ මහා මුළාවකයි. බාබා ප්‍රධානම දෙය පහදා දෙනවා: ඒ ඔහු ස්වදර්ශනචක්‍රධාරි කෙනෙක් බවයි. ඔහුව ඥාන සාගරය කියාත් හඳුන්වනවා. ඔහු තමයි සත්‍යය හා සජීවී ජීව සත්තාව. ඔහු ඔය දරුවන්ට ඔබගේ උරුමය දිනා දෙනවා. බාබා ඔය දරුවන්ට කියනවා: ඔබ එකිනෙකා අතර රණ්ඩු සරුවල් ඇති කර නොගන්න. ලුණු වතුර මෙන් නොවන්න. නිරන්තරයෙන් ප්‍රබෝධමත්ව සිටිමින් සෑම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. සෑම කෙනෙකුටම පියාව අමතක වෙලා. පියා දැන් කියනවා: නිරන්තරයෙන් මා පමණක්ම සිහි කරන්න. අශාරීරික පරමාත්ම දෙවියන් අශාරීරික ජීවාත්මයන් අමතයි. ඔබලා මුලින්ම අශාරීරිකයි. පසුව ශාරීරික වුණා. භෞතික ශරීරයකින් තොරව ජීවයකට කිසිවක්ම කරන්න බැහැ. ජීවයක් ශරීරය අතහැර ගිය විට කිසිඳු චලනයක් ඇත්තේ නැහැ. එම ජීවය ඉක්මනින්ම පිට වී ගොස් තවත් ශරීරයකට ඇතුලු වී තම චරිත කොටස රඟපාවි. මේ සියල්ල ඉතාමත් හොඳින් තේරුම් ගන්න. නොනවත්වාම ඒවා ඔබ තුළට ධාරණය කර ගන්න. ජීවය වන මම බාබාගෙන් මගේ උරුමය

දිනා ගනිමි. ස්වර්ණමය යුගයේ උරුමය ඔබට දී තිබෙනවා. භාරත වැසියන්ට ඔවුන්ගේ උරුමය හිමි කර දුන්නේ අනිවාර්යයෙන්ම පරමාත්ම පියා විය යුතුයි. ඔහු එය දුන්නේ කවදාද? ඉන් පසුව සිදු වූයේ කුමක්ද? මිනිස්සු මේ ගැන කිසිවක්ම දන්නේ නැහැ. පරමාත්ම පියා දැන් ඔබට සියල්ලම කියනවා. ඔය දරුවන්ව ස්ව දර්ශන චක්‍රධාරීන් බවට පත් කරවා තිබෙනවා. ඔබලා උපත් 84 ක් ගන්නවා. මම දැන් නැවතත් වතාවක් පැමිණ සිටිමි. මම ඔබට මේ සියලුම කරුණු ඉතාමත් සරලව කියා දෙමි: පියාව සිහි කර මිහිරි වන්න. ඔබගේ අරමුණ හා ඉලක්කය ඔබ ඉදිරියේ ඇත. සියලුම නීතීඥවරුන්ගේත් නීතීඥවරයා වන්නේ පියායි. ඔහු ඔබව සියලු වාද වලින් මුදවා ගන්නවා. තමන් බාබාගේ දරුවන් බවට පත්ව ඇත කියන අභ්‍යන්තර සතුට ඔබ තුළ මහා ඉහළින් තිබිය යුතුයි. පරමාත්ම පියා අපව භාර ගෙන තිබෙන්නේ අපට අපගේ උරුමය දීමටයි. ඔබ මෙහි පැමිණෙන්නේ ඔබගේ උරුමය දිනා ගැනීමටයි. පරමාත්ම පියා කියනවා: ඔබගේ දරුවන් බලා කියා ගන්නා අතරතුර බුද්ධිය අසීමිත පියාත් රාජ්‍යයත් වෙතට යොමු වී තිබිය යුතුයි. ඉගෙනුම ඉතාමත් පහසුයි. ලෝක පාලකවරුන් බවට පත් කරවනා පියාව ඔබ අමතක කරන්නේ කෙසේද? පළමුවෙන්ම තමන් ජීව බව සලකන්න. මෙම දැනුම පියා ඔබට දෙන්නේ සංගම යුගයේදියි. මන්ද ඔබත් අපිරිසිදු තත්ත්වයේ සිට පාරිශුද්ධ විය යුත්තේ සංගම යුගයේදියි. අච්චා.

සදාදරණීය, ආධ්‍යාත්මික, බ්‍රහ්මාගේ මුවින් උපන්, බ්‍රාහ්මණ වංශයේ සැරසිල්ල වන ඔය දරුවන් දේවතා වංශයටත් වඩා උසස් වූවෝ වෙති. ඔබලා ඉතාමත් උතුම් සේවයක් භාරතයේ ඉෂ්ඨ කරති. දැන් ඔබලා වන්දනීයවුන් වෙමින් සිටී. සිප්පි කටු වන් ඔය වන්දනාකරුවන්ව බාබා දැන් වන්දනීය දියමන්ති බවට පත් කරවයි. එවන් ආධ්‍යාත්මික දරුවන්ව ඉතාමත් සෙනෙහසින් සිහිපත් කර ඔබගේ මව, පියා, බාප්දාදා සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ කරනා සෑම ක්‍රියාවක්ම ශ්‍රීමත් වලට අනුකූල උසස් ක්‍රියාවක් විය යුතුයි. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. දිව්‍යමය ගුණධර්ම ධාරණය කර ගන්න. එකම එක පරමාත්ව පියාගේ උපදෙස් පමණක් අනුගමනය කරන්න.
2. නිරන්තර උද්යෝගයෙන් සිටීමට නම් ස්වදර්ශන චක්‍රය කරකවන්න. කවදාවත් ලුණු වතුර වගේ වෙන්න එපා. සෑම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. ඉතාමත් මිහිරි ප්‍රිය උපදවන කෙනෙක් වන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් පරාර්ථකාමී යෝගීවරයෙකු වී, ගෞරවය ඉල්ලා සිටීම වෙනුවට, සැමට ගෞරවය ලබා දෙත්වා.

යමෙක් ඔබට ගෞරවය දුන්නත්, ඔබව පිළිගත්තත් නැතත්, ඔබ සරළව ඒ තැනැත්තා ඔබේ මිහිරි සහෝදරයා හෝ මිහිරි සහෝදරිය ලෙස සැලකිය යුතුය. ඔබ ඔබේ ස්ව ගෞරවය පවත්වා ගත යුතු අතර, සෙනෙහසේ දෘෂ්ටියෙන් සහ සෙනෙහසේ ආකල්පයෙන්, ජීවාත්ම අවධාන ගෞරවය ලබා දිය යුතුය. "ඒ තැනැත්තා ගෞරවය ලබා දෙන විට මම ගෞරවය ලබා දෙන්නෙමි" යැයි සිතීම රාජකීය යාචක ස්වරූපයයි. මෙහි දී පරාර්ථකාමී යෝගීවරයෙකු වන්න. ඔහු වෙත ආධ්‍යාත්මික සෙනෙහසේ වැසි වැස්සවීමෙන්, සතුරෙකු මිතුරෙකු කරවන්න. යමෙකු ඔබට ගලක් විසි කළත්, ඔබ එම තැනැත්තාට හරවා දෙන්නේ මැණිකකි, මන්ද, ඔබ මැණික් වෙළෙන්දාගේ දරුවන් වන බැවිනි.

**පාඨය:** ලෝකය අලුත් කිරීම කිරීම සඳහා, වචන දෙකක් මතක තබා ගන්න: උපකරණය සහ නිහතමානී.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

සේවයේ සාර්ථකත්වයේ ප්‍රධාන පදනම වන්නේ අත්හැරීම සහ තපස්යාවයි. එවැනි අත්හැරීම හා තපස්යාව තුළ සිටින අය, එනම්, පරමාත්ම පියා කෙරෙහි නිරන්තරයෙන් සෙනහසේ ගැලී සිටින සහ සෙනෙහස, දැනුම,

ආනන්දය, සතුට සහ සාමය යන සාගරයන්හී මුසුව සිටින අය තපස්වීන් ලෙස හැඳින්වේ. එවැනි අත්හැරීම සහ තපස්යාව ඇති අය සැබෑ සේවාධාරීන්ය.